සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

1950

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2014
Year End Evaluation

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade : 09 | විෂයය / பாடம் / Subject : බුද්ධ ධර්මය | පත්‍රය / வினாத்தாள் / Paper : I,II | කාලය / காலம் / Time : පැය 02 |

නම :- ........................................ විභාග අංකය :- ....................

## I කොටස

සැලකිය යුතුයි:

- ප්‍රශ්න අංක 1-20 දක්වා ප්‍රශ්නවලට දී ඇති පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

(01) නායකයෙකු තුළ තිබිය යුතු වටිනා ගුණාංගයක් ලෙස 'කියන දෙය කරන, කරන දෙය කියන ගුණය හැඳින්විය හැකි ය. බුදුරජාණන් වහන්සේ තුළ පැවති මෙම ගුණාංගය නම්

(1) තාදී ගුණයයි. (3) යථාවාදී තථාකාරී ගුණයයි.
(2) පුරිස ධම්ම සාරථී ගුණයයි. (4) සත්ථා ගුණයයි.

(02) සිව් පසයෙන් සංග්‍රහ කරනු ලබන්නේ

(1) දෙවි බඹුන්ට ය. (3) මහා සංඝරත්නයට ය.
(2) දෙමව්පියන්ට ය. (4) දුගී මගී යාචකයන්ට ය.

(03) නව ලෝකෝත්තර ශ්‍රී සද්ධර්මය නුවණැත්තන් විසින් තම තමන්ගේම නුවණින් දැනගත යුතු ය. ධර්ම රත්නය සතු මෙම ගුණය හැඳින්වෙන්නේ,

(1) ඒහිපස්සික යනුවෙනි. (3) ඕපනයික යනුවෙනි.
(2) පච්චත්තං වේදිතබ්බෝ විඤ්ඤූහි යනුවෙනි. (4) ස්වාක්ඛාත යන්නෙනි.

(04) බුද්ධ දේශනාවට අනුව සම ආනිසංස ලබාදෙන දානයන් පිරිනමනු ලැබුයේ,

(1) විශාඛා උපාසිකාව හා අනේපිඬු සිටුතුමාය. (3) සුජාතා සිටුදුව හා අනේපිඬු සිටුතුමා ය.
(2) විශාඛා උපාසිකාව හා බිම්බිසාර රජතුමාය. (4) සුජාතා සිටුදුව හා චුන්ද කර්මාර පුත්‍රයා ය.

(05) බුද්ධ වචනයට අනුව නිසිලෙස බුදුරජාණන් වහන්සේ පිදීමට නම් ඔබ විසින් කළ යුතු වන්නේ,

(1) සුවඳ මල් හා සුවඳ දුම් පිදීම ය. (3) ධර්මානුකූල පිළිවෙත් පිරීම ය.
(2) බුදු පිළිම වන්දනා කිරීම ය. (4) බෝධි පූජා පැවැත්වීම ය.

(06) 'මහරජ, වීර්යය දැනගත යුත්තේ ආපදාවන්හි දී ය.' බුදුරජාණන් වහන්සේ මෙසේ දේශනා කරන ලද්දේ,

(1) කොසොල් රජතුමාට ය. (3) පුක්කුසාති රජතුමාට ය.
(2) බිම්බිසාර රජතුමාට ය. (4) අජාසත් රජතුමාට ය.

(07) මිහිඳු මහ රහතන් වහන්සේ ලක්දිවට වැඩම කර පළමුව දේශනා කළ සූත්‍ර දේශනාව වන්නේ,

(1) ආසිවිසෝපම සූත්‍රයයි. (3) දේවදූත සූත්‍රයයි.
(2) චුල්ලහත්ථි පදෝපම සූත්‍රයයි. (4) දම්සක් පැවතුම් සූත්‍රයයි.

(08) දඹදෙණි යුගයේ රචනා කළ සිංහල මහා කාව්‍ය ග්‍රන්ථයක් වන කව්සිළුමිණ නම් පද්‍ය කෘතියෙන් විස්තර කෙරෙන ජාතක කතා වස්තුව වනුයේ,

(1) කුස ජාතකයයි. (3) මඛාදේව ජාතකයයි.

(2) සත්තුභත්ත ජාතකයයි. (4) සස ජාතකයයි.

(09) මහා ප්‍රජාපතී ගෝතමියගෙන් ආරම්භ වූ භික්ෂුණී ශාසනයේ ආරම්භය සිදුවූයේ,

(1) සැවැත්නුවර ජේතවනාරාමයේ දී ය.

(2) විශාලා මහනුවර කූටාගාර ශාලාවෙහිදී ය.

(3) රජගහනුවර වේළුවනාරාමයේ දී ය.

(4) කිඹුල්වත්පුර නිග්‍රෝධාරාමයේදී ය.

(10) 'මුලදී මිනිසා මත්ද්‍රව්‍ය හා මත්වතුර ගනියි. පසුව මත්ද්‍රව්‍ය හා මත් වතුර මිනිසා ගිල ගනියි' යනුවෙන් ප්‍රකට කියමනක් තිබෙයි. නිරෝගී බව උදෙසා මින් අපගේ ජීවිතයට ගළපා ගත යුත්තේ,

(1) මිනිසා, මත්ද්‍රව්‍ය හා මත්වතුර ගත යුතු බවයි.

(2) මත්ද්‍රව්‍ය හා මත් වතුරට හුරුවීමෙන් මිනිසා විනාශ වන බවයි.

(3) මත්ද්‍රව්‍ය හා මත්වතුර ජීවිතයෙන් බැහැර කළ නොහැකි බවයි.

(4) විශේෂ අවස්ථාවක දී පමණක් මත්ද්‍රව්‍ය හා මත්වතුර ගත යුතු බවයි.

(11) මහා මංගල සූත්‍රයෙහි ඇතුළත් 'ඵුට්ඨස්ස ලෝක ධම්මෙහි චිත්තං යස්ස න කම්පති' යන පාඨයට අනුව අප විසින් වර්ධනය කරගත යුතු ගුණය වන්නේ,

(1) තාදී ගුණයයි. (3) සමානාත්මතා ගුණයයි.

(2) මහා කරුණා ගුණයයි. (4) මුදිතා ගුණයයි.

(12) විපතේ දී කම්පා නොවී ප්‍රඥාවෙන් හා වීර්යයෙන් ක්‍රියා කිරීමේ ආදර්ශය අපට පෙන්වා දෙන ජාතක කතාවක් වන්නේ,

(1) අපණ්ණක ජාතකයයි. (3) උම්මග්ග ජාතකයයි.

(2) ලෝමහංස ජාතකයයි. (4) වණ්ණුපථ ජාතකයයි.

(13) සප්ත අපරිහානීය ධර්ම අනුගමනය කිරීම නිසා බුදුරජාණන් වහන්සේගේ ඇගයීමට ලක් වූ රාජ්‍යයකි.

(1) වජ්ජි රාජ්‍ය ය. (3) කෝසල රාජ්‍ය ය.

(2) මගධ රාජ්‍ය ය. (4) අවන්ති රාජ්‍ය ය.

(14) සම්බුද්ධ ශාසනයේ ප්‍රත්‍යලාභීන් අතර අග්‍රතනතුරින් පිදුම් ලැබුයේ,

(1) ආනන්ද මහ රහතන් වහන්සේ ය.

(2) මහා කාශ්‍යප මහ රහතන් වහන්සේ ය.

(3) මොග්ගලිපුත්තතිස්ස මහ රහතන් වහන්සේ ය.

(4) සීවලී මහරහතන් වහන්සේ ය.

(15) එක්තරා සති වෙළෙඳපොළක එළවළු වෙළෙඳාමෙහි යෙදෙන වෙළෙන්දෙකුගේ වෙළෙඳසල ඉදිරියෙහි 'වස විෂෙන් තොර එළවළු විකිණීමට තිබේ' යන ප්‍රකාශය සහිත පුවරුවක් ප්‍රදර්ශනය කර ඇති අතර ඒ අනුව කටයුතු ද කරයි. ආර්ය අෂ්ඨාංගික මාර්ගයට අනුව මෙයින් ප්‍රකාශ වනුයේ,

(1) සම්මා සංකප්පයයි. (3) සම්මා ආජීවයයි.

(2) සම්මා කම්මන්තයයි. (4) සම්මා වායාමයයි.

(16) දිවා රෑ පින් වැඩෙන පිංකමකි.

(1) අසරණයන්ට පිහිටවීම
(2) ධර්මය ශ්‍රවණය කිරීම
(3) පැන් පොකුණු තැනීම
(4) සතුන්ට කරුණාව දක්වීම

(17) බුදු දහමට අනුව කර්මය පිළිබඳ නිවැරදි වැටහීමක් ලබාගත් පුද්ගලයා

(1) පූර්ව කර්මයන් පමණක් විපාක ලැබෙන බව පිළිගනියි.
(2) කුසලාකුසල කර්මයන්හි විපාක ලබා දෙන බව පිළිගනියි.
(3) ඕනෑම කර්මයක් වෙනස් කළ හැකි බව පිළිගනියි.
(4) සියල්ල කර්මයෙන් පමණක් සිදුවන බව පිළිගනියි.

(18) බුදුරජාණන් වහන්සේ 'කලහ විවාද' සූත්‍රය දේශනා කරන ලද්දේ,

(1) කොසඹෑනුවර ඝෝෂිතාරාම භික්ෂූන් වහන්සේලාට ය.
(2) ශාක්‍ය - කෝලිය දෙපිරිසට ය.
(3) ඡන්න භික්ෂුවට ය.
(4) කිඹුල්වත්පුර සිය ඥාති පිරිසට ය.

(19) 'හේතුං පටිච්ච සම්භූතං - හේතුං භංගා නිරුජ්ඣති' හේතූන් නිසා හටගත් යමක් වේද එම හේතු නැතිවීමෙන් එය නැතිව යන්නේ ය. මෙම අදහස දෙන ඉහත පාඨය සඳහන් වනුයේ,

(1) සංයුක්ත නිකායෙහි සේල සූත්‍රයෙහි ය.
(2) දීඝ නිකායෙහි අග්ගඤ්ඤ සූත්‍රයෙහි ය.
(3) අංගුත්තර නිකායෙහි නිබ්බේධික සූත්‍රයෙහි ය.
(4) ඛුද්දක නිකායෙහි සෝණ සූත්‍රයෙහි ය.

(20) බෞද්ධයෙකු විසින් තෙරුවන් පිළිබඳ ඇතිකර ගත යුත්තේ,

(1) ශ්‍රද්ධාව යි.
(2) භක්තියයි.
(3) තෘෂ්ණාවයි.
(4) කරුණාවයි.

(ලකුණු 2 × 20 = 40)

## II කොටස

- පළමුවන ප්‍රශ්නය සහ තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.

(01) බුද්ධ ධර්මය විෂයට අදාළව පාසල් පාදක ඇගයීම යටතේ ඔබ විසින් සකස් කළ ප්‍රශ්නෝත්තර පොත ඇසුරු කර ගනිමින් පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(1) ප්‍රශ්නෝත්තර පොත සකස් කිරීමේ දී ඔබ අනුගමනය කළ කරුණු දෙකක් ලියන්න.
(2) ඔබ විසින් එම පොතට ඇතුළත් කළ ප්‍රශ්න දෙකක් ලියන්න.
(3) ප්‍රශ්න සකස් කිරීමේ දී පෙළ පොතට අමතරව ඔබ විසින් උපයෝගි කරගත් ග්‍රන්ථ දෙකක් නම් කරන්න.
(4) අත්තකාර සූත්‍රයේ සඳහන් වන පරිදි කිසියම් කාර්යයක් ආරම්භ කොට ඉදිරියට පවත්වාගෙන යාමේ දී ඔබ විසින් අනුගමනය කළ යුතු පියවර සයෙන් දෙකක් දක්වන්න.
(5) ශ්‍රද්ධාවේ ප්‍රභේද දෙක නම් කරන්න.
(6) සිල්වත්වීමෙන් ඔබට මෙලොව දී ලැබෙන ප්‍රයෝජන දෙකක් ලියන්න.
(7) අටලෝ දහම පිළිබඳව උගත් ඔබ එදිනෙදා ජීවිතයේ දී නොසැලී කටයුතු කිරීමට උත්සාහ කළ අවස්ථා දෙකක් පෙන්වා දෙන්න.
(8) ඔබ විසින් සකස් කළ ප්‍රශ්නෝත්තර පොතට ඔබ යෙදූ මාතෘකාව ලියන්න.
(9) මෙම ප්‍රශ්නෝත්තර පොත සකස් කිරීමෙන් ඔබට ලැබුණු ප්‍රයෝජන දෙකක් ලියන්න.
(10) මෙහි දී ඔබට පැන නැගුන ගැටලු දෙකක් පෙන්වා දෙන්න.

(ලකුණු 2×10=20)

(02) පන්සාලිස් වසක් මුළුල්ලේ ලොවට සදහම් මග හෙළිකළ ලොව්තුරා බුදුරජාණන් වහන්සේ උපතින් අසූවන විය නිමවන වෙසක් පුර පොහොය දින පිරිනිවන් පා වදාළ සේක.

(1) සම්බුද්ධ පරිනිර්වාණය සිදු වූ ස්ථානය නම් කරන්න. (ලකුණු 02)

(2) මහා පරිනිබ්බාන සූත්‍රයේ සඳහන් වන පරිදි බුදුරජාණන් වහන්සේගේ අවසන් බුද්ධ වචනය කුමක් ද? (ලකුණු 03)

(3) බුද්ධ චරිතයෙන් ගත හැකි ආදර්ශ මතුකර දක්වමින් ඔබ සාර්ථක ශිෂ්‍ය ජීවිතයක් ගත කරන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 05)

(03) අපි සියලු දෙනා සැපයට, සුවයට කැමති වෙමු. එනමුදු අප ලබන සුවය තාවකාලික ය. ස්ථිර සදාකාලික වූ පරම සුවය නිවන ය.

(1) පරිනිර්වාණයෙහි ප්‍රධාන අවස්ථා දෙක නම් කරන්න. (ලකුණු 02)

(2) දුකට හේතු වූ තෘෂ්ණාවේ ප්‍රභේද තුන දක්වන්න. (ලකුණු 03)

(3) නිවන් සැප ප්‍රාර්ථනා කරන්නෙකු පළමුව අල්පේච්ඡ ජීවිතයකට හුරුවිය යුතු ය. ඒ අනුව ශිෂ්‍යයෙකු වශයෙන් ඔබ අල්පේච්ඡ ජීවිතයකට හුරුවන අයුරු පැහැදිලි කරන්න. (ලකුණු 05)

(04) සම්බුද්ධ ශාසනය ආරක්ෂා කර ගැනීම සඳහාත් වරින් වර ඇති වූ අර්බුදකාරී තත්ත්වයන් සමථයකට පත්කර ගැනීම සඳහාත් බෞද්ධ සංගායනාවන් මගින් සිදු වූයේ අමිල මෙහෙයකි.

(1) තුන්වන ධර්ම සංගායනාව සඳහා මූලිකත්වය දැරූ මහරහතන් වහන්සේ සහ අනුග්‍රහය දක්වූ රජතුමා නම් කරන්න. (ලකුණු 02)

(2) තෙවන ධර්ම සංගායනාවෙන් ලැබුණු ප්‍රතිඵල තුනක් පෙන්වා දෙන්න. (ලකුණු 03)

(3) අපට ලැබුණු නිර්මල බුදු දහම රැකගැනීමේ උතුම් වගකීමට පාසල් ශිෂයෙකු වශයෙන් ඔබ ලබාදෙන දායකත්වය පැහැදිලි කරන්න. (ලකුණු 05)

(05) නිතර පාඩම් අමතක වන ශිෂ්‍යයෙකුට ඒ සඳහා ලබාදිය හැකි හොඳ ම උපදේශය බෞද්ධ භාවනාවයි.

(1) භාවනාවේ දී භාවිත කරන වාඩිවීමේ ප්‍රධාන ඉරියව් දෙක නම් කරන්න. (ලකුණු 02)

(2) විධිමත් භාවනාවකට යොමු වීමේ දී පෙර සූදානමක් ලෙස කළයුතු කාර්යයන් තුනක් ලියන්න. (ලකුණු 03)

(3) පාසල් සිසුවෙකු වශයෙන් ඔබගේ අධ්‍යාපන කටයුතු සාර්ථක කර ගැනීම සඳහා භාවනාවෙන් ලැබෙන ප්‍රයෝජන පිළිබඳව පැහැදිලි කරන්න. (ලකුණු 05)

(06) පුද්ගලයාගේ හා සමාජයේ සදාචාරය හා යහපත් හැසිරීම සඳහා බුදු දහම පෙන්වා දී ඇති ප්‍රධාන ක්‍රියාමාර්ගයක් වන්නේ සීලයයි.

(1) සීලයෙන් සංවර වන ප්‍රධාන දොරටු දෙක කුමක් ද? (ලකුණු 02)

(2) දස කුසල්වලට අයත් කයින් සිදුවන කුසල් තුන මොනවා ද? (ලකුණු 03)

(3) 'සිල්වත් වීමෙන් සදාචාරවත් සමාජයක් ගොඩ නැගෙයි' නිදසුන් දක්වමින් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(07) යහපත් ආර්ථිකයක් ගොඩනගා ගැනීම හා සම්පත්වලින් උපරිම ප්‍රයෝජන ගන්නා ආකාරය සිඟාලෝවාද, ව්‍යග්ඝපජ්ජ ආදී බෞද්ධ සූත්‍රවලින් මැනවින් පෙන්වා දී ඇත.

(1) අය නොඉක්මවා වැය පවත්වා ගැනීම බුදුදහමේ හඳුන්වන්නේ කවර නමකින් ද? (ලකුණු 02)

(2) දීඝජානු කෝලිය පුත්‍රයාට බුදුරජාණන් වහන්සේ විසින් පෙන්වා දෙන ලද භෝග සම්පත්වලට පැමිණෙන උවදුරුවලින් තුනක් දක්වන්න. (ලකුණු 03)

(3) යහපත් පුද්ගලයින් ඇසුර ඔබගේ ශිෂ්‍ය ජීවිතය සාර්ථක කර ගැනීමට බලපාන ආකාරය පෙන්වා දෙන්න. (ලකුණු 05)